## උපාධ්‍යායවරු

අවශ්‍ය ඕනෑම වෙලාවක උපාධ්‍යාවරුන්ගේ උපදෙස් පැනීමට හැකි විය යුතු ය. ශික්ෂණලාභින්ට මග පෙන්වීම් කිරීමේදී වෘර්තීය සහාය ලබා දීමේ ප්‍රමුඛ පුද්ගලයන් වන්නේ උපාධ්‍යාවරුන් ය. ඔවුන් ශික්ෂණලාභින්ට කාරුණික විය යුතුය. ඔවුන්ගේ වගකීම් පහත දැක්වේ.

## ශික්ෂනලාභින් අධීක්ෂණය කිරීම හා ඔවුන්ට වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම.

1. ශික්ෂණලාභින්ගේ වැඩමාලා සහ වාර සටහන් ලිවීමට සහය වීම, ඒවා පරික්ෂා කිරීම හා ඒවා විදුහල්පතිගේ අනුමැතිය සදහා ඉදිරිපත් කරනු ලැබීමට වගබලා ගැනීම.
2. උපදෙස්වල යෝජනා කර ඇති පාඩම් සැලසුම් ආකෘතිය හදුන්වා දෙමින් ඉගෙනුම් ඉගැන්වීම් සම්පත් පිළියල කිරීමට හා පාඩම් සැලසුම් කිරීමට ශික්ෂණලාභින්ට සහය වීම.
3. ශික්ෂණලාභින්ට පාඩම් ඉගැන්වීම් සදහා සහය වීම. සතියකට වරක් පාඩම් නිරීක්ෂණය කර, පාඩම හා පාඩම් සැලසුම පිළිබද ප්‍රතිපෝෂණ සැපයීම.
4. පාසලේ කාර්ය පිළිබද ව ප්‍රත්‍යවේක්ෂණ ජ'නලයක් පවත්වා ගැනීම සදහා ශික්ෂණලාභින්ට සහය වීම. මසකට වරක් ජ'නලය පරික්ෂා කිරීම.
5. ස්වයං තක්සේරුව සදහා ශික්ෂණලාභින් දිරි ගැන්වීම හා ඊට සහය වීම. උපදෙස්වල යෝජනා කොට ඇති ස්වයං තක්සේරු ආකෘතිය ඔවුනට හදුන්වා දීම.
6. සම පදස්ථයන්ගෙන් ඉගෙනීමට ශික්ෂණලාභින් පෙලබවීම හා ඊට සහය වීම.
7. වෘත්තීය දායකත්වය සැපයිය හැකි අවස්ථා ගැන ශික්ෂණලාභින් දැනුම්වත් කිරීම හා ඔව්නට තනි තනිව ද, කණ්ඩායමක් ලෙසද සහය ලබා දීම.
8. ක්‍රියා මූලික පරීක්ෂණ අවස්ථා පිළිබද ව ශික්ෂණලාභින් ට උපදෙස් සැපයීම හා ඔවුන්ගේ ක්‍රියා මූලික පර්යේෂණවලදී පෞද්ගලිකව ද, කණ්ඩායමක් ලෙසද, සහාය ලබා දීම.
9. ශික්ෂණලාභින්ට උපාධ්‍යයවරයකු ලෙස ක්‍රියා කිරීම, මිත්‍රශීලි පරිසරයක් තුළ ඔවුන්ට සහාය දී මග පෙන්වීම, තව දුරටත් දියුණු වීමට මග පෙන්වීම හා විදුහල්පති, ගුරුමණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්, දෙමාපියන් සහ ප්‍රජාව සමග ධනාත්මක සම්බන්ධතාවයක් පවත්වාගැනීමට උපකාරී කිරීම.
10. සතියකට වරක් අඩු ගණනේ දෙපැයක් ශික්ෂණලාභින් මුණගැසී සිමාවාසිකත්වයේ සියලු කාර්යභාර සම්භන්ධයෙන් උපදෙස් ලබාදීම හා මග පෙන්වීම සහ කල් තබා මෙම හමුවීම් නියම කර ගැනීම.
11. පාසලේ අනෙකුත් ගුරුවරුන්ගේ සහය ලබා ගැනීමට ශික්ෂණලාභින්ට උදව් කිරීම.
12. විෂය නිර්දේශ, ගුරු අත්පොත්, අදාළ චක්‍රලේඛ වැනි ලේඛන අධ්‍යනයට උපකාර වීම හා අවශ්‍ය නම් විමර්ශන ද්‍රව්‍ය සපයාදීම.

13. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම සඳහා සමාන්තර පන්ති වල ගුරුවරුන් සමග සහයෝගයෙන් වැඩ කිරීමට ශික්ෂණලාභින්ට සහය වීම.
14. ශික්ෂණලාභින්ට විනය, කාලඥ බව හා ඇඳුම් පැළඳුම් ගැන උපදෙස් දීම.
15. ශික්ෂණලාභින්ට ආදර්ශයට ගත හැකි භූමිකා ආකෘතියට අදාළ චර්යාවක් ප්‍රදර්ශනය කිරීම.

## ශික්ෂණලාභින් තේරුම් ගැනීම

16. "ඉගැන්වීම් පිළිබඳ ජාතික ඩිප්ලෝමාවේ ඇගයීම් පටිපාටියට" අනුව පන්තිකාමර ඉගැන්වීම, වෘත්තිය දායකත්වය හා කාර්ය මූලික පර්යේෂණ තක්සේරු කිරීම හා ශික්ෂණලාභින්ගේ වෘත්තීය දායකත්වයට අදාළ අවසාන ලකුණු ගණනය කිරීම.
17. එක් එක් ශික්ෂණලාභියා වෙනුවෙන් සිදු කෙරුණු තක්සේරු කිරීම පිළිබඳ වාර්තා තබා ගැනීම හා තව දුරටත් සිදු කිරීමට ඇති තක්සේරු කිරීම් ගැන ශික්ෂණලාභින්ට සිහිපත් කිරීම.

## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා සහයෝගයෙන් කටයුතු කිරීම

18. වර්ෂය ආරම්භයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විසින් පවත්වනු ලබන සිමාවාසිකත්වය හඳුන්වා දීමේ රැස්වීමට සහභාගී වීම.
19. ගුරු අධ්‍යාපනඥයන්ගේ පාසල් චාරිකා සටහන ලබා ගැනීම, පාසල් චාරිකාවලදී ඔහු/ඇය හමුවීම හා ශික්ෂණලාභින්ගේ ප්‍රගතිය පිළිබඳ ව ඔහුට/ඇයට දැනුම් දීම.
20. පාසල් වලට පැමිණෙන ගුරු අධ්‍යාපනඥ සමග, ශික්ෂණලාභින්ට ලබාදෙන සියලු වෘත්තීය සහය සම්බන්ධීකරණය කිරීම.
21. උපාධ්‍යාගේ දෛනික ලොග් සටහන් පොත පවත්වා ගැනීම. සියලු උපාධ්‍යාන ක්‍රියාකාරකම් මේ ලොග් පොතේ ඇතුලත් කල යුතුය.
22. "උපාධ්‍යයවරයා /වරියගේ මාසික සිමාවාසිකත්ව වාර්තාව" පිරවීම, එක් පිටපතක් පාසලේ තබා ගැනීම හා එක් පිටපතක් පාසලට පැමිණීමේදී ගුරු අධ්‍යාපනඥයාට ලබා දීම.

## පාසලේ සීමාවාසි වැඩ සටහනේ ගුණාත්මක පවත්වා ගැනීම

23. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විදුහල්පතිවරුන් හා ප්‍රවීණචාර්යවරුන් වෙනුවෙන් පවත්වන පුහුණු වැඩමුළුවලට සහභාගීවීම වීම.
24. ශික්ෂනලාභින්ගේ වෘත්තීය දියුණුව පිලිබඳව අන්‍යෝන්‍ය ලෙස තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස මසකට වරක් විදුහල්පති හා විෂයභාර ගුරුවරුන් හමු වීම.
25. ශික්ෂනලාභින් විසින් ක්‍රියාත්මක කෙරෙන නව අධ්‍යාපන තාක්ෂණය, ගුරු මණ්ඩලයේ සංවර්ධනය සඳහා යොදා ගැනීම.